# CONTINENTAL LAW ASSOCIATES

**ATTORNEYS-AT-LAW, NOTARIES PUBLIC & CORPORATE SECRETARIES**

No.194, Havelock Road,
Colombo 05,
Sri Lanka.

Tel /Fax: 0094-0112501418/0773559870
E-Mail : sandunsg@sltnet.lk
conlawa@gmail.com

**Partners: Sandun Gamage (L.L.B)** ***Attorney - at -Law*****, Shyamila Perera** ***Attorney - at -Law***

2024.11.27

<u>ලියාපදිංචි තැපෑලෙනි</u>

<u>**එන්තරවාසිය.**</u>

කෝසල වික්‍රමසිංහ මහතා,

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල.

මහත්මයාණනි,

<u>**E8 කොරියානු රැකියා වීසා සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශ සිදු කිරීම**</u>

අපගේ සේවාදායකයා වංචාවල, පනාගමුව, මලිගස්පේ ගෙදර, පදිංචි මනුෂ නානායක්කාර මහතාගේ උපදෙස් මත ලියා දන්වමු.

අපගේ සේවාදායකයා වෘත්තියෙන් මාධ්‍යවේදියෙකු වූ අතර පසුව ඔහු පූර්ණ කාලීන දේශපාලයනයට එළඹීමෙන් පසු අවස්ථා දෙකක දී (02) එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දකුණු පළාත් සභාවට මන්ත්‍රීවරයෙකු ලෙසට ද කටයුතු කරන ලදී. පසුව වර්ෂ 2009 දී පැවති මහ මැතිවරණයෙන් ගාලු දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත් වූ අතර ඉන් අනතුරුව 2015 සහ 2020 වසරවලදී පැවති මහ මැතිවරණවලදී ද ගාල්ල දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයකු ලෙස අඛණ්ඩව වසර 14 කට අධික කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරන ලදී.

තව ද අපගේ සේවාදායකයා අප වෙත උපදෙස් ලබා දී ඇති පරිදි ඔහු මීට පෙර විදේශ රැකියා කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස 2016 වර්ෂයේ දී කටයුතු කළ බවත් අනතුරුව පසුගිය රජය කාලයේ දී කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා ලෙසත් කටයුතු කළ බවයි. තවද ඔහු විදේශ රැකියා කටයුතු අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වසර කිහිපය තුළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට සුවිශේෂී රැකියා අවස්ථා ලබා දීමටත්, විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමටත් විශාල කැපවීමකින් කටයුතු කර ලද බවත් එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල විදේශ විනිමය සංචිත ප්‍රමාණයක් ප්‍රේෂණය කිරීමට හැකි වූ බවත්, දැඩි ආර්ථික අවපාතයක වෙලී සිටි ශ්‍රී ලංකාවට එය විශාල පිටිවහලක් වූ බවත් අප වෙත උපදෙස් ලැබී ඇත.

ඊට අමතරව ඔහු ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, ඔවුන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීමටත් විවිධ නිර්මාණශීලී වැඩසටහන් ඉදිරිපත් කරමින් විශේෂයෙන් මින්පෙර ශ්‍රී ලංකාවට විදේශ රැකියා සඳහා විවෘත නො වූ ජපානය, රුමේනියාව, ඊශ්‍රායලය වැනි රටවල විශාල රැකියා අවස්ථා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා විවෘත කිරීමට දැඩිව වෙහෙස වී කටයුතු කළ බවත් එහි ප්‍රතිලාභයන් ද විශාල ලෙස එම විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයටත් හිමි වූ බවත් අප වෙත උපදෙස් ලැබී ඇත.

එවන් පසුබිමක් තුළ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නව සභාපතිවරයා ලෙස ඔබ පත් වීමෙන් පසු වර්ෂ 2024 නොවැම්බර් මස 25 දින දෙරණ නාලිකාවේ ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයෙන් ද එදිනම පැවති 'අද දෙරණ Big Focus' නම් වැඩසටහනට ඔස්සේ ද ඔබ විසින් පදනම් විරහිතව අපගේ

සේවාදායකයාගේ කීර්තිනාමයට හා ඔහුගේ චරිතයට දැඩිව හානිවන වන අපහාසාත්මක ප්‍රකාශ ගණනාවක් සිදු කරනු ලැබූ බවට අපට උපදෙස් ලැබී ඇත.

මින් පහත සඳහන් ඔබගේ ප්‍රකාශය ඍජුවම අපගේ සේවාදායකයා කෙරෙහි සමාජය තුළ අවමන් සහගත පිළිකුල් හැඟීමක් ඇතිවන අයුරින් සහ ඔහු අමාත්‍යවරයෙකු ලෙස නීතිවිරෝධී ක්‍රියාවල යෙදුනු සහ වංචාවලට සම්බන්ධ පුද්ගලයෙකු බවට ඒත්තු ගැන්වීමේ චේතනාවෙන් යුතුව ඔබ විසින් සිදු කරනු ලැබූ බවට අප වෙත උපදෙස් ලැබී ඇත.

එනම් ,

**" අපි හිතනවා මිනිස් ජාවාරමක් දක්වා තල්ලු වෙච්ච ක්‍රමවේදයකට ඇයි මේ රජය පිළිගත් ඇමතිවරයෙක් තල්ලු වුණේ. විශාල සැකසංකාවක් මතුවෙලා තියෙනවා අපිට ඇමතිවරයා අයථා ලාභයක් ලැබුවා කියලා අපිට සැක කරන්න පුළුවන්. දැනට අපි ළඟ සාධක නෑ. තොරතුරු අපි එකතුකරමින් සිටිනවා. කණ්ඩායම් ඉන්නවා. නීත්‍යානුකූලව ගන්න පුළුවන් නීතිමය ක්‍රමවේද තියෙනවා. ඔය එක පාර්ශවයක් විතරයි. මේ E8 විතරක් නෙමෙයි මෙතන ප්‍රශ්නය. ප්‍රශ්න ගොඩක් තියෙනවා."**

තවද ඔබ විසින් සිදු කරනු ලැබූ උක්ත අපහාසාත්මක ප්‍රකාශයන් විවිධ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල මෙන්ම විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ ද එළ වී ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ද වෙන් වෙන් ව නීතිමය පියවර ගැනීම සඳහා අප වෙත උපදෙස් ලැබී ඇති බව දන්වා සිටිමු.

ඒ අනුව ඔබ විසින් ඉහත සඳහන් පරිදි ඉතා අවමන් සහගත ආකාරයෙන් චේතනාන්විතව අපගේ සේවාදායකයා ඉල්ලක්ක කොටගෙන සමාජය ඉදිරියේ ඔහුගේ කීර්තිනාමය බිඳ දැමීමට ද , ඔහුගේ චරිතට ඝාතනය සිදු කිරීමට ද, ඔහුගේ දේශපාලන අනාගතය විනාශ කිරීමට ද, ශ්‍රී ලාංකික ජනතාව තුළ ඔහු කෙරෙහි වෛරී සහ අවමන් සහගත හැඟීමක් ඇති කිරීමේ චේතනාවෙන් කරනු ලැබූ ප්‍රකාශයක් වන බැවින් ඔබ විසින් මෙම ලිපිය ලැබී දින 14 ක් තුළ එකී ප්‍රකාශය ඉල්ලා අස් කරගන්නා ලෙසට ඔබට මෙයින් දන්වා සිටිමු.

විශේෂයෙන්ම ඔබගේ මෙකී සාවද්‍ය, පදනම් විරහිත, අපහාසාත්මක ප්‍රකාශ හේතුවෙන් අපගේ සේවාදායකයාගේ දේශපාලන අනාගතයට දැඩි බලපෑමක් සිදුවන බවත්, ඔහුගේ ජීවිතය පවා ඉන් අනාරක්ෂිතතාවට පත්වන බවටත් අප වෙතට වැඩි දුරටත් උපදෙස් ලැබී ඇත.

ඒ අනුව ඔබ විසින් ඉහත ඔබගේ සාවද්‍ය ප්‍රකාශය පෙර සඳහන් පරිදි මෙම ලිපිය ලැබී දින 14ක් තුළ ඉල්ලා අස්කර නොගන්නේ නම් ඔබ විසින් පදනම් විරහිතව අපගේ සේවාදායකයා ඉලක්ක කොටගෙන කරනු ලැබූ එකී සාවද්‍ය ප්‍රකාශයන් හේතුවෙන් වූ අලාභය අප්‍රතිකාරී වුව ද, එය රුපියල් බිලියනයකට (රු.1 000 000 000 ) තක්සේරු කොට ඔබගෙන් අයකර ගැනීමට සුදුසු අධිකරණයක නඩු පවරන බවත්, එකී වන්දි මුදලට අමතරව ඊට අනුශාංගික වන අලාභ සහ නඩු ගාස්තු අයකරගැනීමට ද වැඩිදුරටත් කටයුතු කරන ලෙසට අප වෙත උපදෙස් ලැබී ඇති බවත් අවසාන වශයෙන් ඔබ වෙත දන්වමු.

ස්තූතියි.

Continental Law Associates

කොන්ටිනෙන්ටල් ලෝ ඇසෝසියේට්ස්

නීතිඥවරුන්

CONTINENTAL LAW ASSOCIATES
Attorneys-at-Law
Notaries Public &
Company
Secretaries.
COLOMBO-SRI LANKA.

පිටපත්

මනූෂ නානායක්කාර මහතා